## 234 ගගන සරන

ගගන සරන කුරුල්ලනේ
දේදුන්නට පැහැය දුන්නේ කවුරුදෝ කියව් කවුරුදෝ
සදාතනික දෙවිඳුන්මය සදාතනික දෙවිඳුන්මය ඒ
දේදුන්නත් උඩින් සරන පිනැති කුරුල්ලනේ මෙලෙස
සුළඟ ගයන ගීය අනුව තාලයකට පියා සලා
පසසව් එතුමා

සඳ වතුරෙහි සිනහ සලන
සුපිපි මලේ ඔබව මැව්වෙ කවුරුදෝ කියව් කවුරුදෝ
සදාතනික දෙවිඳුන්මය සදාතනික දෙවිඳුන්මය ඒ
සඳත් සමඟ සිනහ නගන සුපිපි සමන් මලේ මෙලෙස
සුළඟ ගයන ගීය අනුව පුංචි සුමුදු පෙති විදහා
පසසව් එතුමා

රෑට ඈත අහසෙ සරන
තරු ලඳුනේ ඔබව මැව්වෙ කව්රුදෝ කියව් කවුරුදෝ
සදාතනික දෙවිඳුන්මය සදාතනික දෙවිඳුන්මය ඒ
රන් තරුවේ ලඳුනි මෙලෙස ලොව හැම දෙන නිදි ගත්විට
රෑහැයි ගයන ගීය අනුව නිල් අහසේ බැබලි බැබලි පසසව් එතුමා